සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**6 ශ්‍රේණිය** වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 **40 S I,II**

# පෙරදිග සංගීතය

**කාලය පැය දෙකයි**

නම / විභාග අංකය : ..................................................................................................................................

**සැලකිය යුතුයි :-** • ප්‍රශ්න අංක 01 සිට 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ''සාහිත්‍ය කලාවේදී ''භාෂාව'' මාධ්‍ය වන අතර, සංගීතයේදී සහ නර්තනයේදී මාධ්‍ය වනුයේ පිළිවෙලින්,
   (i) ස්වර සහ හැඩතල වේ. (ii) නාද සහ අභිනය වේ.
   (iii) නාද සහ චලන වේ. (iv) හඬ සහ වර්ණ වේ.

2. පෙරදිග සංගීතයේදී භාවිත වන ''ස,ග,ප,ධ'' යන ස්වර සඳහා අපරදිග සංගීතයේදී C,E,G,A ලෙස යොදාගනී. එම ස්වර සංකේත සඳහා අපරදිග සංගීතයේදී යොදනු ලබන ස්වර නාම වනුයේ,
   (i) Do, Mi, Fa, La. (ii) Mi, Do, So, La.
   (ii) Do, La, So, Re. (iv) Do, Mi, So, La.

3. සුෂිර වාද්‍ය භාණ්ඩ සණයට සහ විද්‍යුත් වාද්‍ය භාණ්ඩ සණයට අයත්වන ස්වර පුවරුවක් සහිත සංගීත භාණ්ඩ යුගලයකි.
   (i) ගිටාරය සහ පියානෝව. (ii) හාර්මෝනියම් සහ ඕගනය.
   (iii) මෙලෝඩිකාව සහ එකෝඩියනය. (iv) බටනලාව සහ කීබෝඩ්.

4. සෑම රටකටම අනන්‍යතාවය දක්වන ගීතයක් ඇත. එය ජාතික ගීය නමින් හඳුන්වනු ලැබේ. ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා ආනන්ද සමරකෝන් මහතා වන අතර, ඉන්දියානු ජාතික ගීයේ නිර්මාතෘවරයා වනුයේ,
   (i) අමීර් කුෂ්රුය පඬිතුමාය. (ii) පණ්ඩිත් අමරදේව ශූරීන්ය.
   (iii) රවීන්ද්‍රනාත් තාගෝර් තුමාය. (iv) ලයනල් එදිරිසිංහ ශූරීන්ය.

5. නළු නිළියන් විසින් ම ගීත ගායනය කරමින් රංගනයේ යෙදෙන නාට්‍ය කලාවක් ලෙස නූර්ති නාට්‍ය හැඳින්විය හැකිය. ඔබ විෂය නිර්දේශයට අයත් නූර්ති නාට්‍ය වල එන ගීත දෙකක් වනුයේ,
   (i) මෙම ගිම්හාන සහ සුවඳ පද්ම ඕලු ආදී.
   (ii) අද වෙස්සන්තර රාජ පුතා සහ සෙන්පතියන් ගැන.
   (iii) සුවඳ පද්ම ඕලු ආදී සහ ඉරෙන් හඳෙන්.
   (iv) තෝව දෙන්නෙත් නරියටයි සහ අද වෙස්සන්තර රාජ පුතා.

★ **අංක 6 සිට අංක 10 ප්‍රශ්නය දක්වා නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ප්‍රශ්නය ඉදිරියේ ඇති හිස්තැන මත යොදන්න.**

6. බටනලාවේ ඇඟිලි තැබීම සඳහා සිදුරු හයක් ඇත. ......................
7. භාරතීය සංගීතයේ ප්‍රධාන පද්ධති දෙක හින්දුස්ථානී සංගීතය සහ කර්ණාටක සංගීතය වේ. ......................
8. නරිබෑනා නාට්‍යයේ සංගීතය නිර්මාණය කළේ දයානන්ද ගුණවර්ධන මහතා විසිනි. ......................
9. ගායනය පුහුණුවන ආධුනිකයකුට ස්වසන අභ්‍යාස කිරීම තුළින් ගායනය පහසු වේ. ......................
10. රබන් පද වාදනය සඳහා අත් රබාන යොදාගනී. ......................

**ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.**

| | | |
|---|---|---|
| 11. | තුණුරුවන් උදෙසා භක්තියෙන් ගැයූ ගීත විශේෂයකි. | තුනකි. |
| 12. | ප්ලූත අකුරක වටිනාකමට සමාන ලඝු මාත්‍රා ගණන | නායකී තාර්. |
| 13. | ''ලංකා ලංකා පෙම්බර ලංකා'' ගීතය ගැයෙනුයේ, | තුන්සරණේ ගී. |
| 14. | සිතාරයේ ප්‍රධාන තත හැඳින්වෙනුයේ, | කළගෙඩි සෙල්ලම. |
| 15. | තානම සහිත ජන ක්‍රීඩා ගීත වෙසෙසකි. | මාත්‍රා 04 බැගිනි. |

**⋆ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා පහත වරහන තුළ දී ඇති පිළිතුරු අතරින් හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර ලියා දක්වන්න.**

**(ග්ලොකන් ස්පීල්/ මිදුලේ වැලි මාළිගාවේ/ නීතිඥ ජෝන්ද සිල්වා/ ආදේශ භාණ්ඩ/ඩබ්.ඩී. අමරදේව මහතා රිද්ම රටා/ බටනලාව)**

16. ඔබ විසින් පංති කාමරයේදී නිර්මාණය කරන ලද සංගීත භාණ්ඩ ............................................ ලෙස නම් කෙරේ.

17. ............................................................ මහතා නූර්ති නාට්‍ය නිෂ්පාදක වරයෙකි.

18. මව්පියගුණ වරුණ ඇතුළත් ළමා ගීතයක් ලෙස ............................................................................. ගීතය දැක්විය හැක.

19. ............................................................ ගැටීමෙන් හඬ නිපදවිය හැකි සංගීත භාණ්ඩයකි.

20. තාල කුසලතාවය වර්ධනයට ............................................................ වාදනය ඉවහල් වේ.

( ලකුණු 1 x 20= 20)

## II පත්‍රය

★ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

1. (i) හිස්තැන් පුරවන්න.
   (a) වයලින් පවුලේ සාමාජිකයින් ගණන .......................................................... කි.

   (b) තාලයක ඇති කුඩාම මිම්ම හඳුන්වනු ලබන්නේ .................................................... නමිනි.

   (c) ආචාර්ය පණ්ඩිත් අමරදේවශූරීන් විසින් සංගීත නිර්මාණය කරන ලද්දේ, ..........................................................

   රටෙහි ජාතික ගීයේය.

   (d) බැතිනා සිරිපා යන ගීතය ............................................................... ස්ථාපන ගීයකි.

   (e) ගිටාරය ............................................................... නැමැති උපකරණයකින් වාදනය කෙරේ.
   (ලකුණු 01 බැගින් 05)

   (ii) ඔබ උගත් ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

2. (i) පෙරදිග සංගිතයේ ස්වර සංකේත ලියා ඊට ඉදිරියෙන් පෙරදිග සංගීතයේ යොදන ස්වර නාම ලියා දක්වන්න. (ලකුණු 03)

   (ii) බටහිර සංගීතයේ ස්වර සංකේත ලියා, ඊට ඉදිරියෙන් බටහිර සංගීතයේ යොදන ස්වර නාම ලියා දක්වන්න. (ලකුණු 03)

   (iii) ස්වර පුවරුවක් සහිත සංගීත භාණ්ඩ හතරක් නම් කරන්න. (ලකුණු 04)

3. (i) ඔබ කැමති සංගීත භාණ්ඩයක රූප සටහනක් ඇඳ එම භාණ්ඩය පිළිබඳව කෙටි විස්තරයක් කරන්න. (ලකුණු 05)

   (ii) ආදේශ භාණ්ඩයක් සාදා ගන්නා ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

4. (i) ඔබ දන්නා නූර්ති නාට්‍ය 2 ක් නම් කරන්න. (ලකුණු 04)

   (ii) නූර්ති ගීතයක් ලියා එහි නිෂ්පාදක වරයා නම් කරන්න. (ලකුණු 06)

5 (i) ඔබ උගත් කෙළි ගී වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 02)

   (ii) කාන්තාවන් සඳහා විශේෂ වූ ක්‍රීඩාවක් නම් කර ඒ පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 05)

   (iii) තුන් සරණේ ගීතයක් ලියා එහි ගී පාද දෙකක් පද ප්‍රස්තාර කර ලියා දක්වන්න. (ලකුණු 03)

# තෙවන වාර පරීක්ෂණය - 2019
## පෙරදිග සංගීතය
06 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය

I කොටස

| | | | |
|---|---|---|---|
| 01) III | 06) ✓ | 11) තුන්සරණේ ගී | 16) ආදේශක භාණ්ඩ |
| 02) IV | 07) ✓ | 12) තුනකි | 17) නීතිඥ ජොන්ද සිල්වා |
| 03) II | 08) X | 13) මාත්‍රා 4 බැගිනි | 18) මිඳුලේ වැලි මාළිගාව |
| 04) III | 09) ✓ | 14) නායකී තාර් | 19) ග්ලොකන් ස්පීල් |
| 05) I | 10) X | 15) කළගෙඩි සෙල්ලම | 20) රිද්ම රටා |

II කොටස

01) (i) (a) හතරකි. (b) මාත්‍රා (c) මාලදිවයින (d) ශුද්ධ ස්වර (e) පික්

(ii) විෂය නිර්දේශයට අදාළ පහත ගී වලින් එකක නිවැරදි ගීත ස්වර ප්‍රස්තාරය සඳහා ලකුණු ලබා දිය යුතුය.
- ⋆ හොඳ දේ හිතමි. ⋆ ගී ගයන මේ කුරුළු යාලුවන් හා
- ⋆ ඈත ආකාසේ ⋆ එකට සතුටු සාගරේ
- ⋆ කඳු පෙළ අතරේ ⋆ කඳු කඳු නැගෙනා ⋆ මුනි සිරි පාදේ
- ⋆ ඈත ඇදී යලි මෑතට පාවේ ⋆ බැතිනා සිරිපා කරුණා ⋆ ඈත හිමේ ගිරි මුදුනේ.

02) (i) ස - සඩ්ජය රි - රිෂභය ග - ගාන්ධාරය ම - මධ්‍යමය ප - පංචමය
ධ - ධෛවතය නි - නිෂාදය

ii) C - Do D - Re E - Mi F - Fa G - So
A - La B - Ti

iii) සර්පිනාව, මෙලෝඩිකාව, පියානෝව, එකෝඩියනය, විදුලි ඕගනය, සින්තසයිසරය.

03) (i) වයලීනය, සිතාර්, බටනලා, ගිටාර්, එස්රාජ් , දිලිරුබා, ඉංග්‍රීසි මැණ්ඩලීනය, සර්පිනාව වැනි සංගීත භාණ්ඩ වලින් එක් රූප සටහනක් ඇඳීම සහ ඒ පිළිබඳව අවම කරුණු තුනක්. ලියා තිබිය යුතුය.
(ii) ඕනෑම ආදේශක භාණ්ඩයක් සාදා ගන්නා ආකාරය සහ මුළු සංගීත භාණ්ඩයේ ආභාෂය පිළිබඳ සලකා ලකුණු ලබා දිය යුතුය.

04) (i) වෙස්සන්තර , දුටුගැමුණු , විධුර

(ii) ඉහත නාට්‍ය වලට අදාළ එක් ගීතයක නිවැරදි පද මාලාව ලියා තිබිය යුතු අතර, නිෂ්පාදක වරයා පහත නම් වලින් එක් අයෙකු විය යුතුය.
වෙස්සන්තර - නීතීඥ ජෝන් ද සිල්වා
දුටුගැමුණු - නීතීඥ ජෝන් ද සිල්වා
විධුර - නීතීඥ චාල්ස් ඩයස්

05) (i) කළගෙඩි සෙල්ලම - එළුවන් කෑම
ඔළිඳකෙළිය - මේවර කෙළිය

(ii) ඔළිඳ කෙළිය හෝ කළගෙඩි සෙල්ලම ලෙස නම් කර කෙටි හැඳින්වීමක් කර තිබිය යුතුය.

(iii) ඕනෑම තුන් සරණේ ගීයක් ලියා එහි පාද දෙකක් නියමිත පරිදි පද ප්‍රස්තාර කිරීම.